1772

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ..................................................................................... විභාග අංකය :- .......................

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- I හා II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I කොටස

- **සිංහල අක්ෂරමාලාව සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට අයත් නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

(01) සිංහල අක්ෂරමාලාව ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එනම්,
(1) ස්වර හා ව්‍යඤ්ජන (2) ස්වර හා දීර්ඝ ස්වර
(3) ව්‍යඤ්ජන හා දීර්ඝ ව්‍යඤ්ජන (4) ව්‍යඤ්ජන හා දීර්ඝ ස්වර

(02) සිංහල අක්ෂරමාලාවේ ව්‍යඤ්ජන අක්ෂර සංඛ්‍යාව වන්නේ,
(1) 48 කි. (2) 38 කි. (3) 42 කි. (4) 18 කි.

- **පහත සඳහන් ප්‍රශ්නවල වාක්‍ය සතරකි. නිවැරදි වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.**

(03) (1) ඇත්තු පෙරහර අලංකාර කරයි. (2) මම උදෑසනින් ම සුබ පතමු.
(3) ඔහු නිතර යහළුවන් ඇසුරු කරති. (4) සොයුරිය කවියක් ගායනා කළා ය.

(04) (1) ගුරුවරු ශිෂ්‍යයන් අගය කරති. (2) ගුරුවරුන් ශිෂ්‍යයෝ අගය කරති.
(3) ගුරුවරුන් ශිෂ්‍යයන් අගය කරති. (4) ගුරුවරු ශිෂ්‍යයෝ අගය කරති.

(05) (1) මිතුරා පොතක් තෑගි කරති. (2) මිතුරිය පොතක් තෑගි කරති
(3) මිතුරෝ පොත් තෑගි කරති. (4) මිතුරෝ පොත් තෑගි කරයි.

(06) **නාම විශේෂණ පදයක් සහිත වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.**
(1) මව දරුවන් පසසයි. (2) ළමයි බයිසිකල් පදිති.
(3) ගුරුතුමා මා ඇමතුවේ ය. (4) අත්තම්මා සුදු සාරිය හැඳ සිටී

(07) **ක්‍රියා විශේෂණ පදයක් සහිත වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.**
(1) ඔහු වනයට පිවිසියේ ය. (2) ගංගා මුහුදට ගලා බසී
(3) ක්‍රීඩකයා වේගයෙන් දුවයි. (4) මම පාසලට යන්නෙමි

- **පහත සඳහන් වචනවලට සමානාර්ථ දෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(08) උදරය - 1. සිරස 2. පපුව 3. බඩ 4. බෙල්ල

(09) නදිය - 1. මුහුද 2. ගඟ 3. වැව 4. ඇල්ල



119

◆ පහත සඳහන් වචනවලට විරුද්ධාර්ථ දෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(10) සරු - (1) සරුසාර (2) සැප (3) නිසරු (4) සතුටු

(11) රූපී - (1) ලස්සන (2) විරූපී (3) රූචි (4) සුරූපී

◆ පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

(12) (1) අවබෝධය (2) ස්තාවර (3) වර්ථමාන (4) ප්‍රතිපල

(13) (1) චන්ද්‍රය (2) සනකය (3) පුෂ්ඵය (4) සංඛ්‍යාව

◆ පහත සඳහන් වාක්‍ය කොටස්වල යෙදී ඇති විරාම ලක්ෂණ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(14) 'ගල්ලෙන බිඳලා ලෙන් දොර හැරලා'
(1) කොමාව (2) පෙරළි කොමා (3) විශ්මයාදී ලකුණ (4) ප්‍රශ්නාර්ථ ලකුණ

(15) මෙතනින් පාර මාරු වෙනු!
(1) ප්‍රශ්නාර්ථ ලකුණ (2) පෙරළි කොමා
(3) විශ්මයාදී ලකුණ (4) කොමාව

(16) පහත සඳහන් පද අතර උක්ත නාම පදයක් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) ගුරුවරුන් (2) දරුවන් (3) මම (4) අප

(17) පහත සඳහන් පද අතර අනුක්ත නාම පදයක් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) ගැමියෝ (2) කවීහු (3) ඔහු (4) මා

◆ පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප අර්ථ දෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(18) "හිනා වෙලා උඩ බලා ගෙන හයියෙන් අඬපාලා ඇහුවා"
(1) අඬලා (2) කෑගසා (3) දුක්වෙලා (4) සතුටුවෙලා

(19) "මම මේ හත් අවුරුදු නියඟකට අහුවෙලා වේළිලා, වේළිලා කෝට්ට වෙලා"
(1) කොට්ටයක් වෙලා (2) මහන්සිවෙලා
(3) අධික ලෙස වේළිලා (4) අධික ලෙස හිරවෙලා

(20) "ගඟට ඉනි කැපුවා වාගේ" යන ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන අර්ථය දක්වෙන පිළිතුර තෝරන්න.
(1) ප්‍රයෝජනවත් දෙයක් කිරීම
(2) නුවණක්කාර දෙයක් කිරීම
(3) නිෂ්ඵල දෙයක් කිරීම
(4) හිතුවක්කාර වැඩක් කිරීම

(ලකුණු 2 × 20 = 40)



120

## II කොටස

- 01 හා 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස සඟරාවක් නිර්මාණය කිරීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) පන්ති කාමරයේ දී නිර්මාණය කළ සඟරාවට යෙදූ නම කුමක් ද? (ලකුණු 02)
(2) සඟරාව නිර්මාණයේ දී ඔබට පැවරුණු කාර්යය කුමක් ද? (ලකුණු 02)
(3) සඟරාවට ඇතුළත් කළ ලිපි දෙකක මාතෘකා සඳහන් කරන්න. (ලකුණු 04)
(4) සඟරාවට ලිපි සකස් කිරීමේ දී තොරතුරු ලබාගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 04)
(5) සඟරාවක් නිර්මාණය කිරීමේ දී ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 16)

(02) පහත දක්වෙන මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 125 කට නො අඩු රචනයක් ලියන්න.
(1) ජලය වටිනා සම්පතකි.
(2) "සමගිය බලය වේ"
(3) උගතමනා ශිල්පයමයි මතු රැකෙනා.
(4) මා කියූ හොඳ ම පොත
(5) ප්‍රිය වචන කතා කරමු. (ලකුණු 14)

(03) පාසලෙන් අනුරාධපුර ප්‍රදේශයට මාරුවක් ලබා ගිය ඔබේ සිංහල ගුරුතුමියට පාසලේ පැවැත්වෙන චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස ඉල්ලමින් ලිපියක් ලියන්න. (ලකුණු 10)

(04) පහත සඳහන් පාඨ, උපුටා ගත් ග්‍රන්ථ හා කතුවරු ලියා දක්වන්න.

| | පාඨය | උපුටාගත් ග්‍රන්ථය | කතුවරයා |
|---|---|---|---|
| (i) | 'මේ තඩ ගෙනියන්නේ තොපේ නැන්දලෑ දිහාට' | | |
| (ii) | 'වැඩක නොයෙදූ සිත තරක අතට ම පෙරළෙත....' | | |
| (iii) | 'අසලැ වූ ගසෙකැ අත්තක් මගේ සොඬට පැමිණියේ යැ' | | |
| (iv) | 'ඌට 'කොළයා' යි කියන්නේ එහෙයිනි' | | |
| (v) | 'මා මෙතන සිටින්නේ නොහඳුනන අවිශ්වාස අයගේ ගමන නතර කිරීමටයි' | | |

(ලකුණු 2 × 5 = 10)

(05) පහත දී ඇති ප්‍රකාශ කවුරුන් විසින් කා හට කරන ලද්දේ දැයි ලියන්න.

| | පාඨය | කවුරුන් විසින්ද? | කා හට ද? |
|---|---|---|---|
| (i) | 'මාගේ පරම මිත්‍ර වූ තෙපි මට කවර හෙයින් ද්‍රෝහික වූ හු ද? | | |
| (ii) | 'මම මහනුවර අසල ගම් වැසියෙක්මි' | | |
| (iii) | 'කුමක් නිසා උනුද? පොකුණට බැස පැන් බොව්' | | |
| (iv) | 'ගොහින් බලපල්ලා මගේ වී ගොඩ' | | |
| (v) | 'එක කාරණේකට නෙමෙයි, දහකාරණේකට උණත් මම එකඟ වෙන්නම්' | | |

(ලකුණු 2 × 5 = 10)

(06) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උගතුන් අතර පැතිරුණු සිංහල කවිය සංස්කෘත භාෂා ඥානය හා පොත් පත් මගින් උකහා ගත් දැනුම මත සකස් වූවකි. සිංහලය හැර වෙනත් භාෂා නොදත්, පොතපතෙහි පැතිරුණු දැනුමක් නැති පොදු ජනයා අතර ද කවි සම්ප්‍රදායක් විය. එය ජන කවිය නමින් හැඳින්වෙයි. ගැමියාගේ එදිනෙදා ජීවිතය ඇසුරෙන් ලද අත්දැකීම් පාදක කරගෙන බිහි වූ ජන කවි බොහෝ ය. ජන කවියෙන් ගැමියාගේ දුක, සතුට, තනිකම ආදී හැඟීම් ප්‍රකාශ කර ඇත. විවිධ වෘත්තීන් ඇසුරෙන් නිර්මාණය වී ඇති ජන කවි අතර පැල්කවි, ගැල්කවි, නෙළුම් කවි, පාරු කවි ආදිය දැකිය හැකි ය.

(i) උගතුන් අතර පැතිරුණු සිංහල කවිය සඳහා ඔවුන් දැනුම ලබාගත්තේ මොනවායින් ද?
(ii) පොදු ජනයා අතර ප්‍රචලිත කවි සම්ප්‍රදාය කිනම් නමකින් හඳුන්වයි ද?
(iii) ජන කවියෙන් ප්‍රකාශ වන ගැමියාගේ හැඟීම් දෙකක් ලියා දක්වන්න.
(iv) ඉහත ඡේදයේ සඳහන් නොවන ඔබ දන්නා වෙනත් ජනකවි වර්ග දෙකක් ලියන්න.
(v) ඔබ දන්නා ජන කවියක් ලියන්න. (ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් ගීත කාණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'රත්න දීප ජන්ම භූමි
ලංකාද්වීප විජය භූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි
ආදි සිංහලේ වීර මී මුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි
මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තේ ඒ අතීත දූ පුතුන්
ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හැළූ ලේ කඳයි

සින්ධූපමාන වැව් තලා මතින් ඇදී
පත්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා හමා
සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නේ උන් හෙළූ ප්‍රාණ වායුවයි.'

(i) මෙම ගීත කාණ්ඩයෙන් කියැවෙන්නේ කුමක් ගැන ද?
(ii) මෙහි සඳහන් වන පරිදි මාතෘ භූමිය සාර වී ඇත්තේ කුමකින් ද?
(iii) ගීත රචකයාට අනුව මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී ඇති දේ ලියන්න.
(iv) මෙහි සඳහන් පරිදි රන් කරල් නමා හමා එන්නේ මොනවා ද?
(v) ඉරි ඇඳි පදවලට සමාන පදය බැගින් ලියන්න. (ලකුණු 2 × 5 = 10)